# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2020 සැප්තැම්බර් මස 25 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2020.09.25 දින නිකුත් කරන ලදී)**


## විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

### විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2020 අංක  දරන විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.*

2. 1907 අංක 19 දරන විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" ලෙස හැඳින්වෙන) තුළ ඇති "මුස්ලිම්වරුන්ගේ විවාහ හැර සහ" යන වචන ඉවත්කිරීම සඳහා එම ආඥාපනතේ දීර්ඝ නාමය සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ "විවාහය" පිළිබඳ අර්ථ නිරූපණය ආදේශ කිරීම.*

3. 64 වන වගන්තියේ "විවාහය" පිළිබඳ අර්ථ නිරූපණය පහත දැක්වෙන වචනවලින් ආදේශ කරන්න:— "විවාහය" යනු "වයස අවුරුදු 18 සහ ඊට වැඩි ඕනෑම පුද්ගලයන් දෙදෙනකු අතර මේ ආඥාපනත යටතේ සිදුවන ඕනෑම විවාහයක් අදහස් වේ".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

4. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.